“ශ්‍රී ලංකාවේ පාසල් තුළ 1996 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන අ.පො.ස (සා.පෙ) නව කෘෂිකර්මය විෂයමාලාව තුළින් කෘෂිකර්ම විද්‍යාලයීය ඩිප්ලෝමා පාඨමාලාව හැදැරිම සඳහා ලබා දෙන පදනම පරික්ෂා කෙරෙණ විමර්ශනාත්මක අධ්‍යයනයක්.”

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ අධ්‍යාපන දර්ශනපති පාඨමාලාව සඳහා ඉදිරිපත් කෙරෙණ පර්යේෂණ නිබන්ධනයයි.

1999-12-20

අධ්‍යාපන පීඨය
කොළඹ විශ්ව විද්‍යාලය

ප්‍රියන්ති සමරවීර
(94 / M. Phil /31)
කෘෂිකර්ම විද්‍යාවේදී - (ගෞරව)
පශ්චාත් උපාධි අධ්‍යාපන- ඩිප්ලෝමා (විශිෂ්ට)

UCLIB
499958

University of Colombo Library Sri Lanka

## සාරාංශය

ශ්‍රී ලංකාව කෘෂිකාර්මික සම්පත් වලින් අනූන, එම අංශයෙන් සංවර්ධනය වීමේ මනා විභවයක් ඇති රටකි. මේ නිසා කෘෂිකර්මය පාසල් විෂයමාලාව තුළ වැදගත් විෂයයකි. 1992 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ නිර්දේශය මත 1996 වසරේ සිට අ.පො.ස. (සා.පෙ) සඳහා නව සංශෝධිත කෘෂිකර්මය විෂය නිර්දේශයක් ක්‍රියාත්මක වේ. මෙහිදී කෘෂිකර්මය යන විෂය වඩාත් ප්‍රායෝගිකරණය කිරිම හා වෘත්තිය නැඹුරුවක් ඇති කිරිම අපේක්ෂිත වන අතර මෙම විෂය නිර්දේශයට අදාලව 1997 වසරේ ප්‍රථම වරට විභාගය පැවැත්විණි.

රටක සංවර්ධනය මැනීමේ නවීන මිනුම් දඬු වලට අනුව රටක ශ්‍රම හමුදාවේ ගුණාත්මක බව ප්‍රධාන සංරචකයක් ලෙස සැලකේ. ශ්‍රම හමුදාවේ අධ්‍යාපන මට්ටම හා රටේ නිෂ්පාදිතය අතර ඇත්තේ ධන සම්බන්ධතාවයකි. මේ අනුව මුළු ශ්‍රම බලකායෙන් 37% ක් වන කෘෂිකර්ම අංශයේ ශ්‍රම හමුදාව මනා දැනුම, කුසලතා, ආකල්ප වලින් පරිපූර්ණ කිරිම සඳහා අධ්‍යාපනය තුළින් වැදගත් කාර්ය භාරයක් ඉටු කල යුතුය. ඕනෑම කාර්මික හෝ කෘෂිකාර්මික ක්ෂේත්‍රයක පුහුණු ශ්‍රම බලකායක් බිහි කිරීමේ වගකීම වෘත්තිය අධ්‍යාපනයට පැවරේ. වෘත්තිය අධ්‍යාපනය සඳහා අවශ්‍ය මූලික නැඹුරුව පාසල තුළින් සැපයිය යුතු බවත්, ඉන්පසු ලබා දෙන වෘත්තිය අධ්‍යාපන වැඩ සටහන් වලින් එය වඩාත් අර්ථවත් කළ යුතු බවත් කියැවේ.

ශ්‍රී ලංකාවේ පාසල් තුළ ක්‍රියාත්මක වන නව කෘෂිකර්මය විෂයමාලාව තුළින් වෘත්තිය කෘෂිකර්ම පාඨමාලා හැදෑරිම සඳහා අවශ්‍ය පදනම් කොතෙක් ලබා දෙන්නේ දැයි සොයා බැලීම සඳහා අධ්‍යයනය සිදු කරන ලදි. මෙහිදී කෘෂිකර්ම අංශයේ වෘත්තිය අධ්‍යාපන පාඨමාලා අතරින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන කෘෂිකර්ම විද්‍යාලයීය ඩිප්ලෝමා පාඨමාලාව අධ්‍යයනය සඳහා තෝරා ගැනිණි. මීට අමතරව නව අ.පො.ස. (සා.පෙ) කෘෂිකර්මය විෂය මාලාව සවිස්තරව විශ්ලේෂණය කිරිමත්, කෘෂිකර්ම අංශයේ වෘත්තීන් හා වෘත්තිය පුහුණුව

පිළිබඳ සිසු ආකල්පය විමසීමත් විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ දී ගුරුවරුන් මුහුණ පාන ගැටළු හඳුනා ගැනීමත්, අධ්‍යයනයේ අනෙක් අරමුණු විය. නිබන්ධනයේ පළමු වන පරිච්ජේදය තුළින් මෙම ප්‍රශ්ණයේ සැබෑ මුහුණුවර හඳුනා ගැනීමට උත්සාහ කෙරිණි.

සාහිත්‍ය විමසුම තුළින් විවිධ විෂය මාලා සංවර්ධන ආකෘතින් හා විවිධ රටවල කෘෂිකර්මය විෂයමාලාවන් තුළින් ශ්‍රී ලංකාවට ලබාගත හැකි ආභාසය කුමක් දැයි සලකා බැලේ .

අධ්‍යයනය විස්තරාත්මක පර්යේෂණ ක්‍රමයට මෙහෙයවන ලදී. අධ්‍යයන නියැදිය ලෙස අධ්‍යාපන ප්‍රදේශ තුනකින් අහඹුව තෝරා ගත් පාසල් විස්සකින් තෝරා ගත් පාසල් සිසුන් හාරසීයයක්, ගුරුවරුන් විස්සක්, කෘෂිකර්ම විද්‍යාල හතරකින් අහඹු ලෙස තෝරාගත් සිසුන් පනහක් හා කථිකාචාර්ය වරුන් පහළොවක් ද, විෂය විශේෂඥයින් පහළොවක් ද, තෝරා ගන්නා ලදී. දත්ත රැස් කිරීම සඳහා අදාල විෂයමාලා ද්‍රව්‍ය, ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා යන ක්‍රම යොදා ගැනිණි. ඉහත තොරතුරු උපයෝගී කරගෙන විෂයමාලාව විශ්ලේෂණය කරන ලදී. එසේම මේ තොරතුරු වගු ප්‍රතිශත හා ප්‍රස්තාර ඇසුරින් අර්ථ කථනය කෙරිණි.

ඉහත ලබා ගත් තොරතුරු තුළින් හෙළිවූ නිගමන වූයේ කෘෂිකර්ම විද්‍යාලයීය ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා 10 -11 කෘෂිකර්මය විෂය මාලාව තුළින් ලබා දෙන පෙර දැනුම හා අත්දැකීම් ප්‍රමාණවත් වන නමුත්, එවැනි පාඨමාලා පිළිබඳව යහපත් ආකල්ප ඇති කිරීම සඳහා විෂයමාලාව අපොහොසත් වන බවය. එසේම විෂයමාලාවේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක නොවන බවද අනාවරණය විය. එසේම විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ දී ගුරුවරුන් විවිධ ගැටළු වලට මුහුණ පාන බවද, විෂයමාලාවේ ප්‍රායෝගික ඇගැයීම ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ සිසු ආකල්පය අයහපත් බවද, අනාවරණය විය නමුත් පැවැති විෂයමාලාවට සාපේක්ෂව නව විෂයමාලාව තුළින් ලබා දෙන වෘත්තීය නැඹුරුව වඩාත් සාර්ථක බව හෙළිවිය .

University of Colombo
Library
Sri Lanka